# වැඩි දියුණු කළ රබර් ක්ලෝන උස් බිම්වල අභියෝග ජය ගනියි

ඒ. නුගවෙල

රබර් වගාවට ශ්‍රී ලංකාවේ හිතකර දේශගුණික තත්වයක් පවතින්නේ තෙත් කලාපයේ සහ ඇතැම් අන්තර් කලාපීය ප්‍රදේශවල ය. එහෙයින් මෙම ප්‍රදේශ ශ්‍රී ලංකාවේ සම්ප්‍රදායානුකූලව රබර් වගා කරන ප්‍රදේශ බවට පත් වී ඇත. එහෙත් රබර් වගාව නිර්දේශ කරන මෙම ප්‍රදේශවල වුවද මුහුදු මට්ටමේ සිට මීටර 300 ට වඩා ඉහළ බිම්වල රබර් වගා කිරීමට නිර්දේශ නොවීය. මෙයට ප්‍රධානතම හේතුව නම් රබර් ගසට සුලබව වැළඳෙන ඔයිඩියම් නම් පත්‍ර රෝගයයි. රබර් වගා කිරීමට නිර්දේශ කරන සෑම ප්‍රදේශයකම මෙම රෝගයේ රෝග කාරකය බහුලව දක්නට ඇති අතර ප්‍රදේශයේ පාරිසරික සාධක අනුව විවිධ තීව්‍රතාවලින් මෙම රෝගය රබර් ගස්වලට වැළඳෙනු ඇත. මුහුදු මට්ටමේ සිට මීටර 300ට වඩා උස් ප්‍රදේශවල සමහර පාරිසරික සාධක, එනම් අඩු උෂ්ණත්වය සහ ඉහළ සාපේක්ෂ ආර්ද්‍රතාවය රබර් ගස්වල මෙම පත්‍ර රෝගය වඩාත් උග්‍ර ලෙස ඇති කිරීමට හිතකර ය.

මීටර 300 ට වඩා උස් ප්‍රදේශවල මෙම පාරිසරික තත්වයන් යටතේ ඔයිඩියම් පත්‍ර රෝගය වැළඳෙන ක්ලෝන වගා කල හොත් වසර පුරා අඛණ්ඩව ඔයිඩියම් පත්‍ර රෝගය එම ගස්වලට වැළඳෙනු ඇති අතර ඒ හේතුවෙන් රබර් ගස් ද්විතියික පත්‍රපතනයට ද ගොදුරු වේ. වසරක් වසරක් පාසා ඇතිවිය හැකි මෙම ද්විතියික පත්‍ර පතනය තුළින් ගසෙහි වර්ධනය දුර්වල වන අතර ලබාගත හැකි කිරි රබර් අස්වැන්නද පහත වැටී ආර්ථික වශයෙන් අලාභදායි තත්වයකට පත්වනු ඇත.

දැනට දශක කීපයකට පෙර පැවති දළ රබර් අපනයනය කළ වකවානුව පසු කර නිමි භාණ්ඩ අපනයනය කරන තත්වයකට ශ්‍රී ලංකාවේ රබර් කර්මාන්තය දියුණු වෙමින් පරිණත අවස්ථාවට ළඟාවෙමින් පවතී. වසර 1990 දී දේශීය මුළු රබර් නිෂ්පාදනයෙන් 24% පමණක් නිමි භාණ්ඩ සෑදීමට යොදාගත් අතර 2007 වසර වන විට එය 65% දක්වා වර්ධනය වී ඇත. මෙම නැඹුරුව විදේශීය විනිමය වැඩි කර ගැනීමට සහ රැකියා අවස්ථා වැඩිකර ගැනීමට දායක වීමෙන් දේශීය ආර්ථිකය ශක්තිමත් කිරීමට හේතුවේ. රබර් කර්මාන්තයේ මෙම වර්ධනය අඛණ්ඩව පවත්වා ගැනීමට ආයෝජකයින්ට හිතකර පරිසරයක් පවත්වා ගත යුතුය. එනම් අවශ්‍ය දළ රබර් ප්‍රමාණය තරඟකාරී මිලකට දේශීය වශයෙන් ඔවුනට ලබාගත හැකි තත්වයක් උදා කළ යුතුය.

වසර 2006 දී සිදුකරන ලද පුරෝකථනයට අනුව 2016 වසරේ දී දේශීය දළ රබර් අවශ්‍යතාවය මෙට්‍රික්ටොන් 150,000 පමණ බව වාර්තා වී ඇත. මෙම ඉලක්කය සාක්ෂාත් කර ගැනීමට නම් 2016 වර්ෂය වන විට රටෙහි වගා කරන ලද මුළු රබර් ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර 150,000 දක්වා සහ ඵලදායිතාවය වසරකට හෙක්ටයාරයකට කිලෝග්‍රෑම් 1500 දක්වා ඉහළ දැමිය යුතුව ඇත. වගා කරන ලද රබර් ඉඩම් ප්‍රමාණය මේ ආකාරයෙන් වැඩි කර ගැනීම ජාතික අවශ්‍යතාවයක් වුව ද සම්ප්‍රදායානුකූලව රබර් වගා කරන ප්‍රදේශ වල ඒ සඳහා ඉඩම් සොයා ගැනීම ගැටළුවකි. මෙම ප්‍රදේශවල දක්නට ලැබෙන නොයෙකුත් සංවර්ධන කටයුතු, නාගරීකරණය, නව කර්මාන්ත සහ බෝග විවිධාංගීකරණය හේතුවෙන් දැනට පවතින රබර් ඉඩම් ප්‍රමාණය පවා අඩු වීමකට ලක්විය හැක. මෙම කරුණු කාරණා ගැන අවධානය යොමු කළ විට රබර් වගාව සඳහා සුදුසු විකල්ප ප්‍රදේශ හඳුනා

ගැනීම කාලීන අවශ්‍යතාවයකි. මෙම අරමුණ මුල්කොට ගෙන ශ්‍රී ලංකා රබර් පර්යේෂණායතනයෙන් නිර්දේශිත නවීනතම තාක්ෂණ සහ ක්ලෝන භාවිතා කර මුහුදු මට්ටමේ සිට මීටර 300 ඉහළ බිම්වල රබර් වගා කිරීමට ඇති හැකියාව අත්හදා බලන ලදි. ඒ සඳහා ප්‍රවේණි විද්‍යාඥයින් විසින් හඳුන්වා දී ඇති ඔයිඩියම් පත්‍ර රෝගයට ප්‍රතිරෝධිතාවයක් දක්වන RRIC 100, RRIC 102 සහ RRIC 130 යන දේශීය ක්ලෝන ද, මධ්‍යස්ථ වශයෙන් ප්‍රතිරෝධිතාවයක් දක්වන PB 260 යන ක්ලෝනය ද යොදා ගැණිනි.

කෘෂි සහ වැවිලි කර්මාන්තයට යොදා ගත හැකි ඉඩම් බහුලව ඇති මධ්‍යම පළාතේ සැන්කුවාර් වතුයායේ මුහුදු මට්ටමේ සිට මීටර 600 - 900 දක්වා උසින් ඇති ඉඩම්, මේ අධ්‍යයනය සඳහා යොදා ගන්නා ලදි. අන්තර් කලාපීය ප්‍රදේශයක් වන මෙම ප්‍රදේශයේ වාර්ෂික වර්ෂාපතනය මිලිමීටර 2000 - 2500 ක් වන අතර වසර පුරා එය සමව පැතිරේ. සාමාන්‍ය උෂ්ණත්වය සෙන්ටිග්‍රේඩ් අංශක $22.5^0$ - $25^0$ වන අතර සාපේක්ෂ ආර්ද්‍රතාවය 68% කි. වර්ණය දුඹුරු සිට කහ පැහැය දක්වා පරාසයක් පෙන්වන වැලි සහිත ලෝම පසක් මෙම ප්‍රදේශයේ දක්නට ඇති අතර පසෙහි pH අගය 4.4 සිට 5.6 දක්වාත්, කාබනික කාබන් ප්‍රතිශතය 1.7 සිට 2 දක්වාත් පමණ වේ.

මෙම අත්හදා බැලීම සඳහා හඳුනාගත් ක්ලෝන ඒ සඳහා හඳුනාගත් වතුයායේ මුහුදු මට්ටමේ සිට මීටර 650ක් උසින් ඇති ස්ථානයක සහ මුහුදු මට්ටමේ සිට මීටර 850 උසින් ඇති ස්ථානයක එක් එක් මට්ටමක හෙක්ටයාර 4 බැගින් හෙක්ටයාර් 8 ක භූමි ප්‍රමාණයක වගා කරන ලදි. ඒ අනුව එක් මට්ටමක එක් ක්ලෝනයකින් හෙක්ටයාර් එකක බිම් ප්‍රමාණයක් වගා කරන ලදි. මෙම ප්‍රදේශයන්හි පවතින කෘෂි දේශගුණික ලක්ෂණ, අත්හදා බැලීමට ලක් කරන ක්ලෝනවල වර්ධනයට, රෝග වලට ප්‍රතිරෝධයක් දැක්වීමේ හැකියාවට, අස්වැන්නට සහ බෝගයේ ආර්ථික ලාභදායිතාවයට ඇති බලපෑම් අධ්‍යයන කරන ලදී.

රබර් පැළ වගාකර වසර හතරකට පසු කරන ලද සංගණනයකට අනුව මීටර 650 උස්බිම් වල කිසිම පැළයක් මිය ගොස් නොතිබුණු අතර මීටර 850 උස් බිම් ප්‍රදේශයේ පැළ මිය ගිය සංඛ්‍යාව 3% පමණ විය. තවද, මෙම මිය ගිය පැළ ඔයිඩියම් පත්‍ර රෝගයට තරමක් ගොදුරු වන RRIC 102 සහ PB 260 යන ක්ලෝන වලට අයත් විය. වානිජ මට්ටමෙන් රබර් වගා කිරීමේ දී එම වගා කරන ප්‍රදේශයට වඩාත් ඔරොත්තු දෙන ක්ලෝන තෝරා ගැනීමේ අවශ්‍යතාවය මින් මනාව පැහැදිලි වේ.

රබර් ගසක වර්ධනය කොපමණද යන්න එහි බද්ධ සංධිස්ථානයේ සිට සෙන්ටිමීටර 120 ක් උසින් වට ප්‍රමාණය මැනීමෙන් සිදු කරනු ලබයි. වාර්ෂිකව ලබාගත් එම දත්ත අනුව මුහුදු මට්ටමේ සිට මීටර 650 ස්ථානයේ පැළ, මීටර 850 ස්ථානයේ පැළවලට වැඩි වර්ධන වේගයක් පෙන්නුම් කර තිබුණි (වගුව 1). කෙසේ වුවද මීටර 850 උසින් ඇති සමහර ස්ථානවල පැළවල වර්ධනය මීටර 650 ස්ථානයේ පැළ වලට සමාන විය. එසේ නොවුන ස්ථානවල රබර් වගාවට හිතකර නොවන සාධක එනම් ඉඩමේ බෑවුම වැඩිවීම, පසෙහි ගැඹුර අඩුවීම සහ අධික සුළං තත්වය හඳුනා ගැනීමට හැකි විය. මේ අනුව පෙනී යනුයේ මීටර 850 ක උස් ප්‍රදේශවලද වගාවට හිතකර සාධක සහිත ඉඩමක් තෝරාගත් විට රබර් වගාව සාර්ථකව සිදු කළ හැකි බවයි.

වගුව 1. *මුහුදු මට්ටමේ සිට විවිධ උස් මට්ටම් වල වගා කරන ලද ක්ලෝන වල සාමාන්‍ය වර්ධන වේග*

| මුහුදු මට්ටමේ සිට උස (මීටර) | ප්‍රතිගුණකය | ගස්වල වයස (අවුරුදු) සහ සාමාන්‍ය වට ප්‍රමාණය(සෙ.මී.) | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | 1 | 2 | 3 | 4 | 5 | 6 |
| 650 | 1 | 8.25 | 14.82 | 24.55 | 32.32 | 37.9 | 44.9 |
| | 2 | 8.75 | 16.22 | 25.70 | 32.80 | 37.07 | 43.2 |
| 850 | 1 | 6.02 | 10.12 | 15.45 | 19.02 | 20.70 | 21.8 |
| | 2 | 6.77 | 11.52 | 16.92 | 20.55 | 22.92 | 25.7 |

සම්ප්‍රදායානුකූලව රබර් වගා කරන ප්‍රදේශවලදී මෙන්ම ගස්වල වර්ධන වේගය ක්ලෝනය අනුව වෙනස් විය. මීටර 650 ස්ථානයේ RRIC 100 සහ RRIC 130 යන ක්ලෝන වැඩිම වර්ධනයක් පෙන්නුම් කරන ලද අතර PB 260 ක්ලෝනයේ එය අවම විය. RRIC 102 ක්ලෝනය මධ්‍යස්ථ වර්ධන වේගයක් පවත්වා ගෙන තිබුණි (වගුව 2). මීටර 850 වගාවේ දී ද ක්ලෝන අතර වර්ධනයේ වෙනස මේ ආකාරයට බොහෝ දුරට සමාන විය. කෙසේ වෙතත් කලින් සඳහන් කළ පරිදි සමස්ථ වර්ධන වේගය මීටර 650 වගාවට වඩා අඩුය. PB 260 සහ RRIC 102 යන ක්ලෝනවල අඩු වර්ධන වේගය එම ක්ලෝන අනෙක් ක්ලෝනවලට වැඩියෙන් පත්‍ර රෝගවලට ගොදුරු විමට තිබෙන නැඹුරුව නිසා විය හැක.

වගුව 2. *වසර 6ට පසු විවිධ ක්ලෝනවල සාමාන්‍ය වර්ධනය (මීටර 650 සහ මීටර 850 වගාවන්ට වෙන්වෙන් වශයෙන්)*

| ක්ලෝනය | සාමාන්‍ය වර්ධනය (සෙ.මී.) සහ මුහුදු මට්ටමේ සිට උස (මීටර්) | |
|---|---|---|
| | 650 | 850 |
| RRIC 100 | 47.5 | 23.4 |
| RRIC 102 | 43.4 | 19.3 |
| RRIC 130 | 48.9 | 30.2 |
| PB 260 | 36.5 | 22.0 |

මීටර් 650 ක උස් ප්‍රදේශවලදී පෙන්වන ලද වර්ධන වේගයන්, සම්ප්‍රදායානුකූලව රබර් වගා කරන ප්‍රදේශවලදී එම ක්ලෝන පෙන්නුම් කරන ලද වර්ධන වේගයන් සමග සන්සන්දනය කරන ලදි. කෙසේ වෙතත් සන්සන්දනයට ලක් කරන වගාවන්හි කළමනාකරන තත්වයන් වෙනස් විම මෙම සන්සන්දනයේ ඇති දුර්වලතාවයකි. මන්දයත්, කළමනාකරන තත්වය වගාවක සාර්ථකත්වයට සෘජුවම බලපාන බැවිනි. වගාවේ මුල් වසර 4 තුළදිම මීටර් 650 වගාවේ සෑම ක්ලෝනයක් ම සම්ප්‍රදානුකූල ප්‍රදේශවල වගා කරන ලද එම ක්ලෝනවල වර්ධන වේගයට වඩා වැඩි වේගයක් පෙන්නුම් කර තිබිණ (රූපය 1). RRIC 130 ක්ලෝනය හැර අනෙක් ක්ලෝනවල වර්ධනය 5 හා 6 . යන වසරවලදී

සම්ප්‍රදානුකූල ප්‍රදේශවල වැඩිය. වසර 5 සහ 6 වගාවන්හිදි PB 260 ක්ලෝනය සම්ප්‍රදායක ප්‍රදේශවල පෙන්නුම් කරන ලද වර්ධන වේගයට සාපේක්ෂව බෙහෙවින් අඩු වර්ධනයක් මීටර් 650 දි පෙන්නුම් කර ඇත. එම ක්ලෝනය ඔයිඩියම් පත්‍ර රෝගයට පාත්‍ර වීමේ ප්‍රවනතාවය මීටර් 650 ක උස් ප්‍රදේශවලදි වඩාත් වැඩිවීම ඊට හේතු විය හැක. RRISL 130 ක්ලෝනය මීටර් 650 වගාවේදි සම්ප්‍රදායික ප්‍රදේශවලට වඩා වැඩි වර්ධනයක් පෙන්නුම් කිරීම තුළින් පෙනි යන්නේ සුදුසු ක්ලෝනය සහ භූමිය තෝරා ගතහොත් එම ප්‍රදේශයේ දේශගුණික තත්වයන් රබර් වගාවට ඉතාමත් හිතකර බවය. එමෙන්ම එම ක්ලෝනවල වර්ධන විභවය ලඟා කරගැනිමට මීටර් 650 ප්‍රදේශයේ ඇති පාරිසරික හා දේශගුණික තත්වයන් උචිත බවත් ය.




**රූපය 1.** උස් බිම් සහ සාම්ප්‍රදායික ප්‍රදේශවල වර්ධන වේගයන්

සාම්ප්‍රදායානුකූලව රබර් වගා කරන ප්‍රදේශවල රබර් වගාවලින් ලබා ගත හැකි උපරිම අස්වැන්න ලබා ගැනිමට ඇති එක් ප්‍රධාන බාධකයක් නම් වර්ෂාවයි. එම ප්‍රදේශවල වසරක රබර් ගසක කිරි කැපීම නිර්දේශිත දින ගණනට වඩා බෙහෙවින්ම අඩු දින ගණනකයි, ඇත්ත වශයෙන්ම කිරි කැපීම සිදුකළ හැක්කේ. කෙසේ වුවද, මීටර් 650 ක උස් ප්‍රදේශවල සිදු කරන ලද වගාවන්හි වර්ෂයකට වැඩි දින ගණනක් කිරි කැපීමේ හැකියාව ලැබී ඇත (වගුව 3). නිර්දේශිත කිරි කැපීමේ දින ගණන සාක්ෂාත් කර ගැනිමට ඇති හැකියාව තුළින් එම ප්‍රදේශවල රබර් වගාවක් ස්ථාපනය කිරීමෙන් උපරිම අස්වැන්නක් ලබා ගැනිමට වැඩි අවස්ථාවක් ඉඩම් හිමියන්ට හිමිවනු ඇත. එම තත්වයට කිරි කපන දින ගණන වැඩිකර ගැනිමට සම්ප්‍රදායික ප්‍රදේශවල සෑම වසරකම විශාල මූල්‍ය හා මිනිස් සම්පත් ප්‍රමාණයක් වැය කරමින් වැහි ආවරණ යොදාගත යුතුය. ඒ සඳහා වාර්ෂිකව ගසක් වෙනුවෙන් කළ යුතු ආයෝජනය රු.40 - 50 පමණ වන බව ගණන් බලා ඇත.

වගුව 3 . *කිරි කැපීමේ පළමු සහ දෙවන වර්ෂවලදී සාක්ෂාත් කරගත් කිරි කැපීමේ දින ගණන*

| කිරි කැපීමේ දින | කිරි කැපීමේ වර්ෂය | |
|---|---|---|
| | 1 | 2 |
| සාමාන්‍ය | 330 | 308 |
| ප්‍රමාදවී | 5 | 0 |
| දෙවරු | 0 | 0 |
| වර්ෂාව* | 17 | 24 |
| වෙනත් නිවාඩු* | 14 | 33 |

(*කිරි නොකැපූ දින)

වර්ෂයක් තුළදී ලබා ගත හැකි මුළු අස්වැන්න එම වර්ෂයේ මාස අතර බෙදී යන ආකාරය මීටර් 650 ප්‍රදේශවල ඇති වගාවල සම්ප්‍රදායික ප්‍රදේශවලට වඩා වෙනස් ආකාරයක් ගනී (වගුව 4). මීටර් 650 වගාවේදී වසරක මාස අතර ලබා ගන්නා ඵලදාවේ විචල්‍යතාවය සම්ප්‍රදායික ප්‍රදේශවලට සාපේක්ෂව බෙහෙවින් අඩුය. පෙර සඳහන් කළ පරිදි අස්වැන්න නෙලීමට වර්ෂාවේ බලපෑම මීටර් 650 ප්‍රදේශයේදී ඉතාමත්ම අඩු මට්ටමක පැවතීම මීට එක් හේතුවක් විය හැක. මෙම තත්ත්වය තුළදී සෑම මසකම සැළකිය යුතු ආදායම් තත්වයක් ලබා ගැනීමට හැකිවීම තුළින් ඉඩම් හිමියාට සහ රබර් කිරි නිස්සාරකයින්ට මීටර් 650 උස් ප්‍රදේශවල රබර් වගා කිරීම තුළින් වාසිදායක තත්ත්වයක් ගෙනදෙනු ඇත.

වගුව 4. *වසර දෙකක දත්ත ඇසුරෙන් වර්ෂයක් තුළදී ලබා ගන්නා අස්වැන්න මාස අතර බෙදී යන ආකාරය*

| මාසය | එක් ගසකින් කැපුමකදී ලබා ගත හැකි අස්වැන්න | වර්ෂයේ සාමාන්‍ය අගයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|
| ජනවාරි | 33.2 | 97.6 |
| පෙබරවාරි | 31.6 | 93.0 |
| මාර්තු | 29.9 | 88.0 |
| අප්‍රේල් | 30.7 | 90.2 |
| මැයි | 34.6 | 101.6 |
| ජුනි | 35.9 | 105.6 |
| ජුලි | 34.0 | 99.9 |
| අගෝස්තු | 32.2 | 94.7 |
| සැප්තැම්බර් | 35.0 | 102.7 |
| ඔක්තෝම්බර් | 33.8 | 99.3 |
| නොවැම්බර් | 37.4 | 109.9 |
| දෙසැම්බර් | 40.0 | 117.4 |

අත්හදා බලන ලද ක්ලෝන අතරින් d/3 ක්‍රමයට කිරි කැපීමට නිර්දේශිත ක්ලෝනවල වසරකදී එක් ගසකින් සහ එක් කැපුමකදී ලැබෙන සාමාන්‍ය අස්වැන්න d/2 ක්‍රමයට කිරි කැපීමට නිර්දේශිත ක්ලෝන වලට සාපේක්ෂව වැඩි අගයක් ගනී (වගුව 5). එසේ වුවත් වසරකට ගසකින් ලබා ගත හැකි මුළු අස්වැන්න d/2 ක්‍රමයට කිරි කැපීමට නිර්දේශ කරන RRIC 100 සහ 102 යන ක්ලෝනවල d/3 ක්‍රමයට කිරි කැපීමට නිර්දේශ කර RRIC 130 සහ PB 260 යන ක්ලෝනවලට වඩා ඉහළය (වගුව 6). d/2 ක්ලෝන ගස්වල වර්ෂයක් තුළදී වැඩි දින ගණනක් කිරි කැපීම මීට හේතු වශයෙන් දැක්විය හැකිය. සම්ප්‍රදායක ප්‍රදේශවලින් දැනට ලබා ගෙන ඇති පර්යේෂණ දත්තවලට අනුව RRIC 100 සහ 102 යන ක්ලෝනවලට අයත් ගසකින් වසරකට ලබා ගත හැකි උපරිම අස්වැන්න වියළි රබර් කිලෝ 5 ක පමණ ප්‍රමාණයකි. තවද, එම උපරිම අස්වැන්න ලබා දෙනුයේ රබර් කිරි කැපීම ආරම්භ කර වසර 5 ක පමණ කාලයකට පසුව ය. මීටර 650 ක උස් ප්‍රදේශවල සිදුකරන ලද මෙම අත්හදාබැලීමෙන් ලබා ගන්නා දත්ත අනුව එම ක්ලෝනවලින් ලබා ගත හැකි උපරිම අස්වැන්න වන ගසකින් වසරකට කිලෝ 5 යන ප්‍රමාණය කිරි කපන ලද දෙවන වසරේදී දීම වාර්තා වී ඇත. මෙයින් අපට පැහැදිළි වන්නේ උස්බිම්වල මෙම ක්ලෝන වගා කිරීමෙන් එම ක්ලෝනවලින් සම්ප්‍රදායික ප්‍රදේශවලින් ලබා ගන්නා අස්වැන්න හෝ ඊට වැඩි අස්වැන්නක් ලබා ගැනීමට හැකියාවක් ගොවීන්ට ලැබෙන බවය.

වගුව 5. *එක් කැපුමකදී ගසෙන් ලැබෙන සාමාන්‍ය කිරි පරිමාව (vtt), රබර් කිරිවල වියළි රබර් ප්‍රතිශතය (DRC) සහ එක් කැපුමකදී ගසකින් ලබා ගත හැකි සාමාන්‍ය අස්වැන්න (gtt) (මුල් වසර දෙක තුලදී ලබා ගන්නා දත්ත ඇසුරෙන් අත්හදා බලන ලද විවිධ ක්ලෝන සඳහා)*

| කිරි කැපීමේ වර්ෂය | දත්තය | **RRIC 100** | **RRIC 102** | **RRIC 130** | **PB 260** |
|---|---|---|---|---|---|
| 1 | vtt (ml) | 98 | 86 | 167 | 116 |
| | DRC (%) | 27.3 | 28.5 | 26.4 | 29.2 |
| | gtt | 26.9 | 23.7 | 43.3 | 33.4 |
| 2 | vtt (ml) | 104 | 93 | 135 | 104 |
| | DRC (%) | 34.2 | 34.9 | 32.1 | 32.6 |
| | gtt | 35.3 | 32.5 | 43.1 | 33.9 |

වගුව 6. *මුල් වසර 2 තුලදී ලබාගත් දත්ත ඇසුරින් අත්හදා බලන ලද විවිධ ක්ලෝන සඳහා වසරක කිරි කපා ඇති මුළු දින ගණන (tda), වසරකට එක් ගසක කිරි කපන ලද දින ගණන (tta) සහ වසරකට ගසකින් ලබා ගන්නා ලද මුළු අස්වැන්න (yta)*

| කිරි කැපීමේ වර්ෂය | දත්තය | **RRIC 100** | **RRIC 102** | **RRIC 130** | **PB 260** |
|---|---|---|---|---|---|
| 1 | tda | 330 | 330 | 330 | 330 |
| | tta | 165 | 165 | 110 | 110 |
| | yta | 4.45 | 3.91 | 4.76 | 3.68 |
| 2 | tda | 310 | 310 | 310 | 310 |
| | tta | 155 | 155 | 103 | 103 |
| | yta | 5.44 | 5.0 | 4.42 | 4.42 |

කිරි කපා වර්ෂ දෙකක කාලයකට පසු වියළි ගස් සම්බන්ධව සංගණනයක් කරන ලදි. ඒ අනුව වියළි ගස් ප්‍රතිශතය වැඩි අගයක් ගැනුනේ RRIC 130 ක්ලෝනයේ ය (වගුව 7). කෙසේ වෙතත් එම අගය සම්ප්‍රදායික ප්‍රදේශවල වාර්තා වන අගයට වඩා අඩු අගයක් වන අතර එය වාසිදායක තත්වයකි.

වගුව 7. *අත්හදාබලන ලද ක්ලෝන වල වියළි රබර් ගස් ප්‍රතිශතය (TPD %)*

| **ක්ලෝනය** | **RRIC 100** | **RRIC 102** | **RRIC 130** | **PB 260** |
|---|---|---|---|---|
| TPD (%) | 2.3 | 1.4 | 3.6 | 0.8 |

මෙම අත්හදා බැලිමෙන් ලබාගත් දත්ත ඇසුරෙන් පැහැදිළි වනුයේ නිර්දේශිත කෘෂි පිළිවෙත් නිසියාකාරව අනුගමනය කළහොත් රබර් ගස මුහුදු මට්ටමේ සිට මීටර් 300 ට වඩා උස්බිම්වල, එනම් මීටර් 850 දක්වා ව්‍යාප්ත කළ හැකි බවය. කෙසේ වෙතත් ඒ සඳහා ඉඩම් තෝරාගැනිමේදි සම්ප්‍රදායික ප්‍රදේශවල සිදුකරන ආකාරයට ම සිදුකළ යුතුව ඇත. එනම් ඉඩමක් රබර් වගාවට සුදුසු විමට අවශ්‍ය සියළු අවශ්‍යතා එම ඉඩමේ තිබිය යුතුය. තවද එම ඉඩම අධික සුළඟට ලක්වේද යන්න ගැනත් විශේෂයෙන්ම සොයා බැලිය යුතු කරුණකි. මන්දයත්, අධික සුළං තත්වයක් යටතේ රබර් පැල වර්ධනය ඉතාමත්ම අඩුවන බැවින් සහ එම තත්ත්වය එය පරිණත රබර් වගාවලට ද අහිතකර බැවිනි. මෙම ප්‍රදේශවල පවතින අඩු උෂ්ණත්වය සහ ඉහළ සාපේක්ෂ ආර්ද්‍රතාවය රබර් ගස්වල පත්‍රරෝග ඇති කිරීමට හිතකරය. එහෙයින් ක්ලෝන තෝරා ගැනිමේදි පත්‍ර රෝගවලට දැඩි ප්‍රතිරෝධයක් දක්වන ක්ලෝන පමණක් ඒ සඳහා යොදා ගත යුතුය. මෙම අත්හදා බැලිම තුළින් ලබාගත් දත්ත අනුව RRIC 100, 102 සහ 130 යන ක්ලෝන මුහුදු මට්ටමේ සිට මීටර් 850 දක්වා ඇති ප්‍රදේශවල වගා කළ හැකි බවත්, ඒ තුළින් ජාතික රබර් නිෂ්පාදන ඉලක්ක කරා යැමටත්, ජාතික ආර්ථිකයට එය ඉහළ දායකත්වයක් ලබා දිමටත් හැකිවනු ඇති බවත් පැහැදිළි වේ.